**ආදරණීය ශ්‍රී ලංකා ඡායාරූප තරගය සහ ප්‍රදර්ශනය**

# Adaraneeya Sri Lanka Photography Competition & Exhibition

**ආදරණීය ශ්‍රී ලංකා රූපවාහිනී සංචාරක වැඩසටහන් මාලාවට සමගාමීව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ සංචාරක අධිකාරිය මගින් සංවිධානය කෙරේ.**

**ඡායාරූප ඉදිරිපත් කිරිමේ අවසාන දිනය - 2017 සැප්තැම්බර් මස 10 වන දින**
**ඡායාරූප ප්‍රදර්ශනය පැවැත්වෙන දිනය - 2017 සැප්තැම්බර් 27 සිට 30 දක්වා**

## තරග කොන්දේසි (Entry Rules)

### ඇතුළත් වීමේ ක්‍රමය (How to Enter)

**තරග අංශ :**

- **සොබාදහම** (Nature)
- **සංස්කෘතික උත්සව හා උරුමයන්** (Cultural Festival & Heritage)
- **ත්‍රාසජනක ක්‍රීඩා** (Adventure Sports)

සෑම තරග කරුවෙකුටම එක් අංශයක් සඳහා ඡායාරූප 04 බැගින් ඉදිරිපත් කළ හැකිවේ. එක් අංශයක් සඳහා ඉදිරිපත් කරන ලද ඡායාරූප තවත් අංශයක් සඳහා ඉදිරිපත් කළ නොහැකිය. වර්ණ (Color) ඒක වර්ණ :Monochrome)යන ඕනෑම ආකාරයකින් නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

### ඡායාරූප හිමිකම් අයිතිය (Copyright)

තරගය සඳහා ඉදිරිපත් කරන සෑම නිර්මාණයකම අයිතිය ඉදිරිපත් කරන්නා සතුවේ. ප්‍රසිද්ධ කරන ලද නිර්මාණ හිමිකරුගේ අවසරයෙන් තොරව බාහිර පාර්ශවයක් විසින් භාවිතා කළ හොත් ඒ සඳහා සංවිධායක මණ්ඩලය වග කියනු නොලැබේ. එමෙන්ම ප්‍රදර්ශනය සඳහා තෝරා ගත් ඡායාරූප ප්‍රදර්ශනයේ ප්‍රචාරණය සඳහා මෙන්ම වානිජ අරමුණු වලින් තොරව සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිතා කිරිමේ අයිතිය ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුවේ.

### ගොනු නම් කිරීම (File Naming)

පහත දැක්වෙන ආකාරයට ගොනු නම් කළ යුතුය.

**තරග අංශය- ඉල්ලුම්පතේ සඳහන් ආකාරයට නිර්මාණයේ අංකය - තේමාව**

### තරග කාණ්ඩ (Categories)

| | |
|---|---|
| **සොබාදහම** | **N** |
| **සංස්කෘතික උත්සව හා උරුමයන්** | **C** |
| **ත්‍රාසජනක ක්‍රීඩා** | **A** |

උදාහරණ ලෙස: සොබාදහම් අංශය - 03 වන ඡායාරූපය - තේමාව: **Hunting Leopard**

**N** - 3 - **Hunting Leopard - jpg**

(සිංහලෙන් වුවද තේමාවන් සඳහන් කළ හැකිය)

**ඡායාරූප අර්ථකථනය:**

- **සොබාදහම** (Nature)

සොබාදහම් ඡායාරූප යන්නෙන් සොබාදහමේ සියලු අංශ නිරූපණය වන ඡායාරූප අදහස් වේ.මීට මානව වංශය හෝ පුරාවිද්‍යාව නිරූපණය වන ඡායාරූප අදාළ නොවේ. එමෙන්ම මානවයිනගේ මැදිහත් වීමෙන් සොබාදහමේ සිදු කරන ලද වෙනස්කම් දැක්වෙන ඡායාරූප සොබාදහම් අංශයට ඇතුළත් නොවේ. එමෙන්ම ඡායාරූප රාමු **(Cropping)** කළ හැකි වුවත් ඡායාරූපයට ආංකිත **(Digital)** ආකාරයෙන් කොටස් ඇතුළත් කිරිම හෝ ඉවත් කිරීම නොකළ යුතුය. එමෙන්ම මෙම තරග අංශය සඳහා භූමි දර්ශන **(Landscape)** හා වන ජීවී **(Wildlife)** වශයෙන් වන කොටස් දෙකක් ඇතුළත් වේ.
ඡායාරූප තුළින් මානවයින් නිරූපණය වන්නේ නම් එය සොබාදහමේ ස්වභාවික අංගයක් විය යුතුය.

- **සංස්කෘතික උත්සව හා උරුමයන්** (Cultural Festival & Heritage)

ශ්‍රී ලංකාවේ විවිධ ආගම් හා විවිධ සංස්කෘතීන් තුළ විවිධ උත්සව දක්නට ඇත. මෙම උත්සවයන්ට අයත් විවිධ අවස්ථා හා ඓතිහාසික උරුමයන් විදහා දැක්වෙන නිර්මාණාත්මක ඡායාරූප මේ සඳහා ඉදිරිපත් කළ හැකිය. උදාහරණ ලෙස දළදා පෙරහැර, විවිධ ශාන්ති කර්ම, විවාහ මංගල්‍ය උත්සව, ජීවන රටාවන් ආදිය දැක්විය හැකිය.

- **ත්‍රාසජනක ක්‍රීඩා (Adventure Sports)**

සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ත්‍රාසජනක ක්‍රීඩා (Adventure Sports) විදහා දැක්වෙන නිර්මාණාත්මක ඡායාරූප මෙම අංශය සඳහා ඉදිරිපත් කළ හැකිය.

**නිර්මාණ ඉදිරිපත් කරන ආකාරය (Submission)**

අපගේ අයදුම් පත්‍රය පුරවා Online ක්‍රමයට **adaraneeyasl@gmail.com** වෙත එවිය හැකිය. නැතිනම් **CD** හෝ **DVD** පටයක ඡායාරූප සහ ඉල්ලුම් පත්‍රය ඇතුළත් කොට **"ආදරණීය ශ්‍රී ලංකා ඡායාරූප තරගය" ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව,කොළඹ 07** යන ලිපිනයට තැපැල් මගින් හෝ ගෙනවිත් භාර දිය හැකිය. තැපැල් මගින් එවන **CD** හෝ **DVD** පට තැපෑලේදී හානි නොවන අන්දමට සුරක්ෂිතව එවිය යුතුය.

සෑම නිර්මාණයක්ම **JPEG Format** ක්‍රමයට අනුකූලව එවිය යුතුවේ. පිළිඹිබුවල උපරිම ප්‍රමාණය (Maximum Image Size) **1400 pixels** පළලින් **1050 pixels** උස සහ **300** p.p.i (pixel per image) විය යුතුවේ. පිළිඹිබු (Image) ගොනු **2 MB** වලට වඩා විශාල නොවිය යුතුය.

**ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනැමීම (Awards)**

| සොබාදහම | සංස්කෘතික උත්සව හා උරුමයන් | ත්‍රාසජනක ක්‍රීඩා |
|---|---|---|
| **රන් සම්මානය සමග රු.50,000/=** | **රන් සම්මානය සමග රු.50,000/=** | **රන් සම්මානය සමග රු.50,000/=** |
| **රිදී සම්මානය සමග රු.40,000/=** | **රිදී සම්මානය සමග රු.40,000/=** | **රිදී සම්මානය සමග රු.40,000/=** |
| **ලෝකඩ සම්මානය සමග රු.30,000/=** | **ලෝකඩ සම්මානය සමග රු.30,000/=** | **ලෝකඩ සම්මානය සමග රු.30,000/=** |
| **සම්මාන සහතික පත්‍ර පහක්** | **සම්මාව සහතික පත්‍ර පහක්** | **සම්මාන සහතික පත්‍ර පහක්** |

සෑම නිර්මාණයක්ම ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් තෝරා ගනු ලැබේ. ප්‍රදර්ශනය සඳහා තෝරා ගනු ලබන නිර්මාණවල High Resolution Image Files සංවිධායකවරුන් විසින් ඉල්ලා සිටි සැනින්ම ලබා දීමට නිර්මාණකරුවන්ට හැකි විය යුතු වේ.

නිර්මාණ විනිශ්චය සම්බන්ධයෙන් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන අතර ප්‍රදර්ශනයේ අනෙක් සෑම කරුණක් සම්බන්ධයෙන්ම සංවිධායකවරුන්ගේ තීරණය අවසාන තීරණය වේ.